

ඡායාරූපය - ස්ටූඩියෝ ටයිම්ස් ලිමිටඩ්

# මූලික ආර්ථික ධාවක දේශගුණික විපර්යාසවලට මුහුණදිය හැකි ලෙස ශක්තිමත් කිරීම

දශක තුනක් තිස්සේ පැවතුනු යුදගිනි නිවා වේගවත් සංවර්ධන මාවතකට සහ ආර්ථික පුනර්ජීවනයකට අවතීර්ණ වී ඇති ශ්‍රී ලංකාව මේ වන විට ඉදිරි දශකය සඳහා දුම්රිය, මහාමාර්ග සහ ගුවන් ගමනා ගමන සේවා මෙන්ම නිවාස, බලශක්ති වැනි ක්ෂේත්‍ර සඳහාද නව ආයෝජන සැලසුම් සකස් කර ඇත.

මෙයට සමාන්තරව, සංචාරක සහ නාවික වැනි ප්‍රධාන කර්මාන්ත ක්ෂේත්‍ර ව්‍යාප්ත කිරීමට සහ නවීකරණය කිරීමට අවශ්‍ය අඩිතාලමද සකස් කර ඇත. රජයේ ප්‍රතිපත්ති මෙහෙයවන "මහින්ද චින්තන නව ශ්‍රී ලංකාවක් සඳහා දැක්ම (2006 - 2016)" සහ "මහින්ද චින්තනः ඉදිරි දැක්ම" යන ප්‍රතිපත්ති මාලාවලට අනුව, 2007 -2016 දක්වා වූ කාලය තුල ආයෝජනය කිරීමට අපේක්ෂිත මුළු මුදල ශ්‍රී ලංකා රුපියල් ට්‍රිලියන 1.4 ක් (ඇමරිකා එක්සත් ජනපද ඩොලර් බිලියන 12.5) පමණ වේ. මෙම ආයෝජන හරහා යටිතල පහසුකම්, ආර්ථික සහ සමාජ වර්ධනය සිදුවීමෙන් රට විශාල පෙරළියකට බඳුන් වෙනු ඇත.

දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා ශ්‍රී ලංකාවේ ධාරිතාවය ශක්තිමත් කිරීම.

දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා වූ ජාතික ක්‍රමෝපායයන්:

උපාය මාර්ග **#4**

මිනිස් ක්‍රියාකාරකම් නිසා සිදුවන මිහිතලය උණුසුම් වීමෙන්, සංවර්ධන සැලසුම් වලට අහිතකර බලපෑම් එල්ල විය හැකිය. එනිසා, මෙම ආයෝජන සුරක්ෂිත කරගැනීමට නම්, සංවර්ධන සැලසුම්කරණයේදී එවැනි දන්නා සහ සිදුවිය හැකි බලපෑම් පිළිබඳව සැලකිලිමත් වියයුතුයි.

# දේශගුණික විපර්යාසවල බලපෑම්

අපගේ ප්‍රධාන ආර්ථික ක්ෂෙත්‍ර දේශගුණ විපර්යාස වලට ගොදුරුවීමට ඇති ඉඩකඩ බොහෝය. පහත සඳහන් තත්වයන් මෙයට උදාහරණ වේ:

- වෙරලබඩ ප්‍රදේශවල පිහිටා ඇති අපගේ සමහර ප්‍රධාන මහාමාර්ග සහ දුම්රිය මාර්ග දැනටමත් වෙරළ ඛාදනය නිසා අවදානමට ලක්වේ. මුහුදු ජල මට්ටම ඉහල යාම, කුණාටු රළ පහර සහ වෙරළ ඛාදනය දිගටම සිදුවුවහොත් එවැනි ආර්ථික ජීවනාල හානියට හෝ විනාශයට පත්විය හැකිය.
- වනජීවීන්ගෙන් පොහොසත් වනාන්තරත්, අලංකාර වෙරළ තීරයත්, අපගේ ප්‍රධාන සංචාරක ආකර්ෂණයන් වේ. දේශගුණ විපර්යාස මේවා සියල්ලටම බලපෑම් කිරීම තුලින් අපගේ අනාගත සංචාරක ආදායම් වලට බලවත් පහරක් එල්ල කරනු ඇත.
- අප රටේ ඇතැම් ප්‍රදේශවල ජනතාව සෑම වසරකදීම ගංවතුර සහ නායයාමේ උවදුරු වලට මුහුණදේ. දේශගුණ විපර්යාස නිසා මෙම ආපදාවල ප්‍රවණතාවය සහ සිදුවන හානිය වැඩිවනු ඇති අතර, එමගින් යටිතල පහසුකම් වලට සහ ආර්ථිකයට දැඩි පීඩනයක් ගෙනදෙනු ඇත.



ඡායාරූපය - ස්ටූඩියෝ ටයිම්ස් ලිමිටඩ්



ඡායාරූපය - ස්ටූඩියෝ ටයිම්ස් ලිමිටඩ්

# තේමා

සංචාරක, ප්‍රවාහන සහ වානිජ කෘෂිකර්මාන්ත වැනි මූලික ආර්ථික ධාවක□ දේශගුණ විපර්යාසවල බලපෑමට මුහුණ දිය හැකි ලෙස සංවර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් අවශ්‍ය වෙයි. දේශගුණ විපර්යාස වලට අනුවර්තනය වීම සඳහා වූ ක්‍රමෝපාය සැකසීමේදී විවිධ පාර්ශවකරුවන්ගෙන් තොරතුරු විමසන ලදී. මෙහිදී ප්‍රමුඛත්වය ලබා දිය යුතු ගැටළු සහ ප්‍රතිචාර හඳුනාගත් අතර ඒවා මූලික තේමාවන් 4 ක් යටතේ වර්ග කරන ලදී.

## යටිතල පහසුකම් වලට දේශගුණ විපර්යාස නිසා සිදුවන බලපෑම අවම කිරීම

මහාමාර්ග, දුම්රිය මාර්ග, ජලාපවහන පද්ධති සහ අනෙකුත් යටිතල පහසුකම් ගොඩනගා ඇත්තේ දේශගුණ විපර්යාස පිළිබඳ අවධාරණයකින් තොරවය. මෙය ඇතැම් විට වැදගත් නොවුවද, සමහර අවස්ථා වලදී තීරණාත්මකය. උදාහරණ ලෙස මුහුදු ජල මට්ටම ඉහල යාමත් සමඟ වෙරළ කලාපයේ ඉදිකර ඇති ඇතැම් මහාමාර්ග සහ දුම්රිය මාර්ග ජලයෙන් යටවනු ඇත. එමනිසා අප ප්‍රථමයෙන්ම වඩාත්ම හානිවිය හැකි ජාතික මට්ටමේ යටිතල පහසුකම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකොට ඒවායේ වටිනාකම තක්සේරු කලයුතුයි. අනතුරුව, ඒවා දේශගුණ විපර්යාස වලට ඔරොත්තු දිය හැකි ආකාරයට වැඩි දියුණු කිරීම සඳහා තීරණ ගත යුතුව ඇත. ඇතැම් ඒවා දියුණු කල හැකි අතර සමහර ඒවා සම්පූර්ණයෙන්ම නැවත ස්ථානගත කල යුතුවේ. දැනට භාවිතයේ ඇති ඇතැම් තාක්ෂණික ක්‍රමවේද බැහැර කිරීමට සිදුවිය හැකිය. උදාහරණ ලෙස වැඩිවන උෂ්ණත්වයත් සමඟ මහාමාර්ග තැනීමට යොදාගන්නා තාර තවදුරටත් යෝග්‍ය නොවනු ඇත.

## වැවිලි ක්ෂෙත්‍රයට දේශගුණ විපර්යාස මඟින් සිදුවිය හැකි බලපෑම අවම කිරීම

ශ්‍රී ලංකාවේ විදේශ විනිමයට තවමත්  ඉතා ඉහළ දායකත්වයක් සපයන තේ, පොල් සහ රබර් වැනි ප්‍රධාන වැවිලි භෝගවලට දේශගුණික විපර්යාස මඟින් සිදුවිය හැකි බලපෑම් පිළිබඳව පර්යේෂකයින් තවමත් අධ්‍යයන සිදුකරමින් සිටියි. ඇතැම් වැවිලි කර්මාන්තකරුවන් මෙම අවදානම තවමත්  හඳුනාගෙන නැති අතර සිදුවිය හැකි බලපෑමෙන් මෙම කර්මාන්ත ආරක්ෂා කර ගැනීම සඳහා ක්‍රමවත් අනුවර්තන සැලසුමක් සකස්කොට නොමැත. දේශගුණික විපර්යාස අහිතකර තර්ජන මෙන්ම හිතකර අවස්ථා ද ලබාදෙන නිසා අපට නිවැරදි මාවත පෙන්වාදීම සඳහා අදාළ පර්යේෂණ බෙහෙවින් වැදගත් වනු ඇත.

## දේශගුණ විපර්යාස වල බලපෑමට මුහුණදීම සඳහා මූලික කර්මාන්ත ක්ෂෙත්‍ර වලට සහය වීම

ඒදිනෙදා මුහුණදෙන අභියෝග වලට පිළිතුරු සොයන ඒක පුද්ගල කර්මාන්තකරුවන් සහ ව්‍යවසායකයින්ට, ක්‍රමිකව මතුවෙන තර්ජන හෝ අවස්ථා පිළිබඳ දීර්ඝකාලීන දැක්මක නියැලීමට කාලය නොමැත. මෙය ජාතික සැලසුම්කරුවන්ට, කර්මාන්ත නියාමනය කරන්නන්ට, බැංකුකරුවන්ට සහ ආයෝජකයන්ටද එකසේ බලපාන තත්ත්වයකි. දේශගුණ විපර්යාස වල බලපෑම් සාම්ප්‍රදායික ව්‍යාපාර කිරීමේ පිළිවෙත් වෙනස් කිරීමට බලකර සිටින අතර වඩාත් පුළුල් මධ්‍යගත සහ දීර්ඝකාලීන දැක්මක් සඳහා අතවනයි. විශාල කර්මාන්ත වලට අයත් තාක්ෂණික දැනුම සහිත කළමනාකරුවන් සහ කර්මාන්ත ජාල සමඟ මෙවැනි  සාකච්ඡා ආරම්භ කිරීමෙන් අනෙක් විවිධ ස්ථරයන් නියෝජනය කරන කොටස්ද ආවරණය වන පරිදි සාකච්ඡා ව්‍යාප්ත කල හැකිවේ.

## දේශගුණ විපර්යාස වලට ගොදුරුවීමට ඇති ඉඩකඩ පිළිබඳව ප්‍රධාන ආර්ථික ක්ෂෙත්‍ර දැනුවත් කිරීම

ප්‍රධාන ආර්ථික ක්ෂෙත්‍ර දේශගුණ විපර්යාස පිළිබඳ එතරම් දැනුවත් වී නොමැත. එමනිසා දේශගුණික විපර්යාස වලට ගොදුරුවීමට ඇති ඉඩකඩ, විකල්ප අනුවර්තන සහ පිරිවැය පිළිබඳ දැනුවත් වීමට ඉඩ සලසා දියයුතුව ඇත. දේශගුණ විපර්යාසවල අවදානම ආර්ථික ක්ෂෙත්‍රයට අනුගත කිරීමේදී සමබර ප්‍රවේශයක් අවශ්‍ය වේ. නිදසුනක් සලකා බලමු. සංචාරක හෝටල් ආයෝජකයන් පාරිසරික බලපෑම් තක්සේරුවේ (EIA) අඩංගු ක්‍රියා පටිපාටි මගින් පාරිසරික යෝග්‍ය බවට සහ අනුකූලතාවයට මාර්ගෝපදේශනයක් ලබාගනී. දේශගුණ විපර්යාස පිළිබඳ විමර්ශණයක් දැනට පාරිසරික බලපෑම් තක්සේරුවේ අඩංගු වී නොමැත. ප්‍රජාවද ඔවුන්ගේ වෘත්තියට සහ ආදායම් උපයන කර්මාන්ත වලට දේශගුණ විපර්යාසවලින් සිදුවන බලපෑම පිළිබඳව දැනුවත් වී නොමැත. එවැනි දැනුවත් වීමකට ඉඩ සලසා දිය යුතුව ඇත.



ඡායාරූපය - ස්ටූඩියෝ ටයිම්ස් ලිමිටඩ්



ඡායාරූපය - ස්ටූඩියෝ ටයිම්ස් ලිමිටඩ්

අවිනිශ්චිත දේශගුණ විපර්යාස සමග ජීවත් වීම හැරෙන්නට වෙනත් විකල්පයක් නොපෙනේ. එම නිසා ශ්‍රී ලංකාවද දේශගුණ විපර්යාස වල බලපෑම්වලට අනුව හැඩ ගැසීම අනිවාර්යයෙන්ම සිදුකල යුතුවේ. එමගින් අප රටෙහි ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය බාධාවකින් තොරව අඛණ්ඩව සිදුකරගෙන යාමට අවස්ථාව සැලසෙනු ඇත. එවිට දුප්පත්කම අවම කිරීම, ආහාර හා ජල සුරක්ෂිතභාවය සහ මහජන සෞඛ්‍යය නංවාලීම සඳහා සිදුකරන ආයෝජනයන් ආරක්ෂා කරගතහැකි වේ.

මෙම පත්‍රිකාව ආසියානු සංවර්ධන බැංකුවේ අනුග්‍රහය සහ තාක්ෂණික සහය වෙනුවෙන් වූ ADB TA 7326 SRI:
***දේශගුණ විපර්යාස වලට මුහුණදීම සඳහා ශ්‍රී ලංකාවේ ධාරිතාවය නංවාලීමේ ව්‍යාපෘතිය මඟින් සකස් කරන ලදී.***

ආසියානු සංවර්ධන බැංකුව පාරිසරික අමාත්‍යංශය සමඟ ක්‍රියාත්මක කල මෙම ව්‍යාපෘතිය තිරසාර ආර්ථික සංවර්ධනය අඛණ්ඩව සිදුකරගෙන යන අතරතුරම දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය වීමේ ජාතික ක්‍රමෝපාය සම්පාදනය කරන ලදී. එය අනුමත වූ විට ඵලදායී පරිසර කළමණාකරණයක් සහ වඩා විධිමත් ලෙස සංවිධානය කරගත් පාර්ශවකරුවන්ගේ සහභාගීත්වයද ඒකරාශී කරගනිමින් දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය ලඟා කරගත හැකිවේ.

**වැඩි විස්තර සඳහා සම්බන්ධ විය යුත්තේ**
දේශගුණ විපර්යාස ලේකම් කාර්යාලය, පරිසර අමාත්‍යංශය,
පලමු මහල, 980/4A  වික්‍රමසිංහ පෙදෙස, ඇතුල් කෝට්ටේ, ශ්‍රී ලංකාව.
දුරකථන: +94 11 2883 481 සහ  +94 11 2883 368
වෙබ් අඩවිය: http://www.climatechange.lk/adaptation/